# මහපොළ ශිෂ්‍යත්ව සහතික ප්‍රදානය - 2018/2019

2018/2019 ප්‍රවේශ වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්වය සඳහා හිමිකම් ලබා ඇති සිසුන් පිළිබඳ විස්තර www.mahapola.lk වෙබ් අඩවිය වෙත පිවිස එහි වෙබ් link හි Mahapola Scholarship වෙත පිවිසීමෙන් මෙන්ම www.ruh.ac.lk වෙබ් අඩවියේ Student Affairs වෙත පිවිසීමෙන් දැනගත හැකිය. ඒ අනුව මහපොළ භාරකාර අරමුදල වෙත online මගින් ලබා දී ඇති තොරතුරු සනාථ කිරීම සඳහා 2020.09.03 දිනට පෙර පීඨ කාර්යාලයෙන් මහපොළ ආකෘති පත්‍රය ලබා ගෙන එය සම්පූර්ණ කර සහතික කරන ලද බැංකු පාස් පොතෙහි පැහැදිලි ඡායා පිටපතක් සමග පීඨය වෙත බාර දී මහපොළ සහතික පත්‍රය ලබා ගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

අදාල ආකෘති පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම හා සහතිකපත්‍රය භාර ගත් බවට අත්සන් තැබීම අනිවාර්ය වන අතර සහතික පත් බාර නොගැනීම සහ අසම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීම ශිෂ්‍යත්වය අවලංගු වීමට හේතු විය හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

මේ සමග අමුණා ඇති ලේඛනයේ නම් සඳහන් ශිෂ්‍යත්වලාභීන් 2020.08.31 දිනට පෙර මහපොළ භාරකාර අරමුදලේ online මගින් තොරතුරු සම්පූර්ණ කරන ලෙසද දන්වා සිටිමි.

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය කටයුතු
2020.08.21

පිටපත් - නියෝජ්‍ය උපකුලපති

පීඨාධිපති - වෛද්‍ය/ඉංජිනේරු/කෘෂිකර්ම/විද්‍යා/කළමනාකරණ හා මූල්‍ය/ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ/ සම සෞඛ්‍ය විද්‍යා/ තාක්ෂණ පීඨය

නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර ලේඛකාධිකාරී- වෛද්‍ය/ඉංජිනේරු/කෘෂිකර්ම/ විද්‍යා/කළමනාකරණ හා මූල්‍ය/ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ/ සම සෞඛ්‍ය විද්‍යා/ තාක්ෂණ පීඨය - අදාල සිසුන් දැනුවත් කිරීම සඳහා